**ශීර්ෂය - 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**මූල්‍ය නොවන වත්කම්**

දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශය විසින් 2021 මැයි 05 දින බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලද රු.2,500,000 ක් පිරිවැය වූ ඩබල් කැබ් රථයේ වටිනාකම මූල්‍ය නොවන වත්කම් තුල වාහනවල වටිනාකමට ඇතුළත් කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් වැඩියෙන් පෙන්වා තිබුණු අතර අමාත්‍යාංශයේ භාවිතය සඳහා ලබාගෙන ඇති ජල හා ජල ප්‍රවාහන අමාත්‍යාංශය සතු රු.6,000,000 ක් වටිනා ජීප් රථය මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කර තිබුණි. තවද, වටිනාකම තක්සේරු කර නොමැති වාහන 02 ක වටිනාකම මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලද රු.2,500,000 ක් වටිනා ඩබල්කැබ් රථය හා භාවිතය සඳහා අමාත්‍යාංශය වෙත පවරා ඇති ජල ප්‍රවාහන අමාත්‍යාංශය සතු පිරිවැය රු.6,000,000 ක් වූ ජීප් රථයේ වටිනාකම 2022 වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කර ඇති අතර අනෙකුත් වාහන 02 හි වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ආයතනය සතු සියළු වාහනවල වටිනාකම විධිමත් පරිදි තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වන අතර වෙනත් ආයතන වෙත පවරා දී ඇති වාහනවල වටිනාකම ගිණුම්වලින් ඉවත්කිරීම සඳහා කටයුතු කළ යුතු බව. |
| (ආ) | වර්ෂය අවසානයට අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සතුව වාහන 50 ක් පැවති අතර 2021 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ACA(06) ආකෘතිය අනුව වාහන 19 ක වටිනාකම රු.71,350,000 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි වාහන 31ක වටිනාකම ඇතුලත්ව නොතිබුණි. | වාහන 03 ක් 2022 වර්ෂයේදී වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇති අතර වාහන 18 ක් සඳහා තක්සේරුව ලද පසු මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරමි. තවද, ඉන් වාහන 10 ක් අපහරණයට යොමුකර ඇත. | ආයතනය සතු සියළු වාහනවල වටිනාකම විධිමත් පරිදි තක්සේරු කර ගිණුම් ගත කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම.**<br><br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතු වුවත්, පුනරාවර්ථන වැය විෂයයන් 13 ක් සඳහා සියයට 12 සිට සියයට 100 දක්වා ද මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සියයට 43 සිට සියයට 100 දක්වා ද පරාසයක මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර විචලතාවයන් පැවතුණි. | ඇතැම් වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම ඇතැම් වැය විෂයයන් සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන අපේක්ෂා කළ පරිදි වියදම් නොවීම හා ප්‍රාග්ධන වැය විෂයයන් 03 කට අදාලව මූලික වියදම් ඇස්තමේන්තු සංශෝධනය කිරීම මෙම විචලනයන්ට හේතු විය. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු බව. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සියළුම බැරකම් සිදුවූ වහාම සටහන් කර ගත යුතු වුවද, සංස්කෘතික අංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබූ අතර ඒ හේතුවෙන් ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ බැරකම් හා බැඳීම් ප්‍රකාශනය අනුව බැරකම් නිවැරදි බවට විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. | 2022 වර්ෂයේ සිට බැඳීම් හා බැරකම් ප්‍රකාශය නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවති. | බැඳීම් හා බැරකම් ප්‍රකාශය නිවැරදිව පවත්වා ගෙන යායුතු බව. |

### 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු | නිවැරදි කර ගැනීම සඳහා කටයුතු කරමින් ප්‍රගතිය පිළිබඳ අඛණ්ඩව පසු විපරම් සිදු කරනු ලැබේ. | ඒ අනුව කටයුතු කර ඒ පිළිබඳව විගණකාධිපති වෙත වාර්තා කළ යුතු බව. |

කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.4 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්ෂාවලදි නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදය | | | | |
| (i) 4.2.5,4.5 හා 4.6 උපවගන්ති | 397,087 | බුද්ධශාසන අංශයේ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ රු.167,055 ක ණය ශේෂය වර්ෂ 02 කට වැඩි කාලයක සිට ද සංස්කෘතික අංශයේ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ රු.128,732 ක ණය ශේෂය වර්ෂ 05 කට වැඩි කාලයක සිට ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>තවද, සංස්කෘතික අංශයේ මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.101,300 ක ණයශේෂය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීම සඳහාත් මියගිය නිලධාරියාගෙන් අයවිය යුතු ණය ශේෂය වැන්දඹු විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට සඳහාත් කටයුතු කරමින් පවතී. | විධිවිධාන ප්‍රකාරව ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) 4.2.3 උප වගන්තිය සහ 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/RED/2015/08පොදු (i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3(ඉ) ඡේදය | 686,867 | බුද්ධශාසන අංශයේ වැඩ තහනමට ලක් වු නිලධාරියෙකුගේ රු.32,155 ක ණය ශේෂය වර්ෂ 04කට වැඩි කාලයක සිට ද සංස්කෘතික අංශයේ වැඩතහනම් කර ඇති නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.654,712 ක් වු ණය ශේෂය වර්ෂ 03 ක සිටද අයවිය යුතුව පවතින අතර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බුද්ධශාසන අංශයේ වැඩ තහනමට ලක්වු නිලධාරියාගෙන් අයවිය යුතු ණය ශේෂය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නීති අංශයට යොමුකර ඇත. සංස්කෘතික අංශයේ වැඩතහනම් කර ඇති නිලධාරීන් තිදෙනෙකුගේ ණය ඇපකරුවන්ගෙන් අයකර ගැනීමටත් දෙදෙනෙකුගේ ණය ශේෂ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමටත් සිව්දෙනෙකුගේ ණය ශේෂ ඉදිරියේදී අයකර ගැනීමටත් කටයුතු කරමින් පවති. එක් නිලධාරියෙකුගේ ණය ශේෂය දැනටමත් අයවී ඇත. | විධිවිධාන ප්‍රකාරව ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>(i) මාර්ගෝපදේශ 3.2 | 49,841,036 | ඇස්තමේන්තු අගය පිළිවෙලින් රු.20,009,609 ක්, රු.14,665,744 ක් හා රු.15,165,683 ක් වූ බමුණාකොටුව, මාවතගම හා පොල්ගහවෙල සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් කොන්ත්‍රාත්, තරඟකාරි මිල ගණන් කැඳවීමෙන් තොරව ආයතන 05 කින් සීමිත මිල ගණන් කැඳවා සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පුද්ගලික සමාගමට පවරා තිබුණි. තවද ,සීමිත මිල ගණන් කැඳවූ ආයතන තෝරා ගැනීම, විනිවිදභාවයකින් යුතුව සිදු කර නොතිබුණි. | මාවතගම සහ පොල්ගහවෙල සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ආයතන 05 කින් මිල ගණන් කැඳවූවද මිල ගණන් ඉදිරිපත් කර තිබුණේ සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහාද ආයතන 05 කින් මිල ගණන් කැඳවා අවම මිල ඉදිරිපත් කළ සංස්කෘතික හා ඉදිකිරීම් පුද්ගලික සමාගමට ලබාදීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව තරඟකාරි මිල ගණන් කැඳවිය යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) මාර්ගෝපදේශ 3.2.2 (ඈ), 3.10.1 සහ 7.8 (අ) | | උක්ත සඳහන් කොන්ත්‍රාත්කරුට ICTAD ලියාපදිංචිය පවතීද යන්න තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉහත කොන්ත්‍රාත් 03 එකවර පවරා තිබුණද ඊට අවශ්‍ය සම්පත් හා කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත්කරු සතුව පවතීද යන්න සලකා බලා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.2 අනුව සීමිත මිල ගණන් කැඳවා එවා ඇති මිල ගණන් අනුව සහ ප්‍රසම්පාදන කමිටුවේ තිරණ පරිදි කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (iii) මාර්ගෝපදේශ 5.4.8 (අ) | | පොල්ගහවෙල සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාල කාර්යසාධන සුරක්ෂණය දින දීර්ඝ කර ලබාදී නොතිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම නිම නොකිරීමෙන් වූ අලාභය පියවා ගැනීමට නොහැකිව තිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් කාර්යයය සුරක්ෂිත 2018 ජුනි 23 දක්වා දිර්ඝ කර ඇත. | . -එම- |
| (iv)මාර්ගෝපදේශ 8.12.2 | | පොල්ගහවෙල හා බමුණාකොටුව සංස්කෘතික මධ්‍යස්ථානවල ඉදිකිරීම්වලට අදාල වැඩ අවසන් කිරීමේ සහතික උපදේශක වෙතින් ලබා ගෙන නොතිබුණි. | බමුණාකොටුව සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් පිළිබඳව එහි උපදේශන ආයතනය වන කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2019.12.26 දිනැතිව රඳවුම් මුදල් නිදහස් කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇතත් පොල්ගහවෙල සංස්කෘතික මධ්‍යස්ථානයේ වැඩ මෙතෙක් අවසන් කර නොමැත. | -එම- |
| (v) මාර්ගෝපදේශ 8.13.4 | 7,751,543 | පොල්ගහවෙල හා බමුණාකොටුව සංස්කෘතික මධ්‍යස්ථානවල ඉදිකිරීම්වලට අදාල | පොල්ගහවෙල සංස්කෘතික මධ්‍යස්ථානයේ ටයිල් ඇතිරීමේ කාර්යය ප්‍රධාන කාර්යයට අමතරව | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | පිළිවෙලින් රු.2,195,881 ක් හා රු.5,555,662 ක් වූ අමතර වැඩ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කර නොතිබුණි. | සිදුකරනු ලැබූ නව කාර්යයක් බැවින් මෙතෙක් ඉදිකිරීම් සිදු කළ සමාගම වෙතම ලබා දීමට ප්‍රසම්පාදන කමිටු තීරණයක් මඟින් අනුමත වී ඇත.<br>බමුණාකොටුව සංස්කෘතික මධ්‍යස්ථානයේ භූමිය අවට පස් පිරවීම හා රැඳවුම් බැම්මක් ඉදිකිරීමට මිල ගණන් කැඳවා තිබුණ ද එම කාර්යය අදාල සමාගම වෙත ලබා දී නොමැත. ඒ සඳහා ඇස්තමේන්තු පිරිවැය අධික බැවින් පඩි පේළි සකස් කර කුඩා කොටසක් සඳහා පමණක් පස් පිරවීමට යෝජනා වී ඇත. ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත 2020.01.21 දින ප්‍රතිපාදන නිදහස් කර ඇත. | |
| | (vi) මාර්ගෝපදේශ 8.14 | 84,843 | මාවතගම සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාල කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කරන ලෙස කොන්ත්‍රාත්කරු ඉල්ලා තිබුණද දීර්ඝ කිරීම ලබාදී නොතිබූ අතර ඊට අදාලව ගෙවා තිබූ රු.8,484,290 ක ගෙවීමෙන් සියයට 1 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි. | මාවතගම සංස්කෘතික මධ්‍යස්ථාන කොන්ත්‍රාත්තුවේ කාලය 2017.07.30 දක්වා දීර්ඝ කර ගැනීමට අදාල අනුමැතිය 2016.06.13 දින ලේකම්තුමා විසින් ලබා දී ඇත. | -එම- |
| (ඇ) | 2019 ජුනි 27 දිනැති අංක 2019/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | | |
| | (i) 03 (ඉ) ඡේදය | 479,268 | සංස්කෘතික අංශයේ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය | මෙම ණය ශේෂ 05න් එක් ණය ශේෂයක් පියවා ඇත. තවත් අයෙකු විසින් රු.40,000 ක් ගෙවා ඇති | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | යුතු එකතුව රු.479,268 ක් වූ ණය ශේෂ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | අතර ඉතිරි ණය ශේෂ නිරවුල් කරන ලෙස ණයකරුවන් සහ ඇපකරුවන් වෙත අඛණ්ඩව ලිපි යොමු කරමින් පවතී . ණය අය කර ගැනීමේ ප්‍රගතිය විමසීම සඳහා මාසිකව රැස්වීම් පවත්වනු ලැබේ. | |
| | (ii) 03,04 සහ 05 ඡේද | 1,426,148 | සංස්කෘතික අංශයේ අත්තිකාරම් “බී” ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ වසර ගණනාවක සිට පැවත එන රු.1,426,148 ක් වූ ශේෂ ගලපා තිබූ අතර එම ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අත්තිකාරම් ගිණුමෙහි හඳුනා නොගත් රු.1,426,148 ක ශේෂය 2010 වර්ෂයේ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය පිහිටුවන ලද අවස්ථාවේදී පැවති ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ශීර්ෂ අංක 142 යටතේ සඳහන් පෙර වර්ෂවල වෙනස්කම් වන අතර ඒ හා සම්බන්ධ තොරතුරු හා දත්තයන් නොමැතිවීම හේතුවෙන් පොත්වලින් ඉවත් කිරීමට අනුමැතිය ඉල්ලා ඇත. | -එම- |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 811,250 | (i) 1952 ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩල ආඥා පනත යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා චිත්‍රපට, DVD හා කෙටිකතා සමීක්ෂණය සඳහා 2021 වර්ෂයේදී මණ්ඩලයේ සාමාජිකයන් 15 දෙනෙකුට භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව, රු.811,250 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ සාමාජිකයින්ට චිත්‍රපට පූර්ව දර්ශන නැරඹීම සඳහා ලේකම් විසින් 2007.01.02 දින රු.500/ ක් ගෙවීම ද 2008.08.08 දිනැතිව රු.1,000/- ක් දක්වා වැඩි කිරීම ද අනුමත කර ඇත. දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන අතර, අනුමැතිය ලැබීමෙන් පසු පමණක් ඉදිරියේදි ගෙවීම් කරනු ලැබේ. | දීමනා ගෙවීමේදි චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | 103,500 | (ii) ආඥා පනතේ 5(1) හා 6(1) වගන්ති ප්‍රකාර සහතික පත්‍ර නිකුත් කිරීමේ සහතික කරන බලධාරියා ලෙස මණ්ඩලයේ සභාපතිවරයා කටයුතු කරනු ලබන අතර සභාපතිවරයාගේ මාසික දීමනාව ලෙස රු.75,000 ක් ගෙවනු ලබයි. ඒ අනුව සභාපතිවරයාගේ සාමාන්‍ය රාජකාරියෙන් කොටසක් ලෙස ගැනෙන චිත්‍රපට, නාට්‍ය හා DVD නැරඹීම/සමීක්ෂණය සඳහා 2021 වර්ෂය තුලදී රු.103,500 ක් සභාපතිවරයාට ගෙවා තිබුණි. | 2005 වසරේ සිටම සභාපතිවරුන් සඳහා චිත්‍රපට නැරඹීම, ඩී.වී.ඩී. පට හා නාට්‍ය පිටපත් කියවීම් සඳහා ද ගෙවීම් කර ඇත. ඉදිරියේ දී නිසි අනුමැතියකින් තොරව නොගෙවීමට උපදෙස් ලබා දී ඇත. | නිලධාරීන් වෙත විධිමත් ලෙස පවරන ලද රාජකාරි වෙනුවෙන් අතිරේක දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු බව. |
| (ඉ) 2017 අප්‍රේල් 19දිනැති අංක 2017/03 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | (i) සංස්කෘතික මධ්‍යස්ථානවල පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර හඳුන්වා දී නොතිබුණි. | අවම සේවක සංඛ්‍යාවක් සිටින බැවින් සෑම මධ්‍යස්ථානයකටම ඇඟිලි සලකුණු යන්ත්‍රයක් යෙදීමේදී දරන්නට සිදුවන පිරිවැය අධික වීම නිසා ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපිත කිරීමට නොහැකි වී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව සේවකයන්ගේ පැමිණීම තහවුරු කර ගනිමින් නිවාඩු සහ මාසික වැටුප් ගෙවීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බව. |

**2.5 අවිධිමත් ගනුදෙනු**

විධිමත් අනුමැතියකින් තොරව පහත සඳහන් ගණුදෙනු සිදු කර තිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 1644(11) පරිදි මෝටර් වාහනයක් පුද්ගලික වැඩපලකදී අලුත්වැඩියා කර ගැනීමේදී එක් එක් වැඩය වෙනුවෙන් ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද රු.839,370 ක් වැයකර අවස්ථා 7කදී සිදුකල අලුත්වැඩියා වලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වාහන අලුත්වැඩියා කිරීම සඳහා යොමුකරන ආවරණ ලිපිය මෙම තොරතුරු ඇතුලත් වන පරිදි සංශෝධනය කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**2.6 තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය යටතේ වූ කොන්ත්‍රාත් සඳහා වූ මුළු රැඳවුම් මුදල් ශේෂය රු.99,596,333 ක් වූ අතර ඒ තුළ වූ බුද්ධශාසන අංශයට අදාළ රැඳවුම් මුදල් ශේෂය රු.57,343,077 ක් විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් වර්ෂ 02 ඉක්ම වූ රු.1,789,359 ක් වූ තැන්පතු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | **අදහස් දක්වා නොමැත.** | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම.** | | |
| (i) රු.මිලියන 1350 ක (අදියර 1-5 දක්වා) මූලික ඇස්තමේන්තුවක් මත 2005 වර්ෂයේ ආරම්භ කර 2017 සැප්තැම්බර් 30 දින නිම කිරීමට නියමිතව තිබූ විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව අදියර 05 ක් දක්වා | I සිට V අදියර දක්වා ඉදිකිරීම්වල හඳුනාගත් අඩුපාඩු සකස් කරන ලෙස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ උපදේශක කාර්යාංශය වෙත දන්වා ඇත. පරීක්ෂා කිරීම්වලදි හඳුනාගත් අඩුපාඩු සකස් කිරීමට අදාල විශේෂඥ | අදාල ඉදිකිරීම් සැලසුම් කළ පරිදි සම්පූර්ණ කර භාවිතයට ගතයුතු බව. |

| | | |
|---|---|---|
| ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1245.18 ක පිරිවැයක් දරා තිබුණු අතර 2021 වර්ෂයේ ආරක්ෂක සේවා හා විදුලි බිල්පත් පියවීම් සඳහා රු.මිලියන 2.72 ක් ගෙවා තිබුණි. ඉදිකිරීම් අවසන් කර විද්‍යාලංකාර භාරය වෙත භාරදීමෙන් පසුව ගොඩනැඟිල්ල බදු දීමෙන් ලැබෙන ආදායමෙන් මෙම ව්‍යාපෘතියේ vi වන අදියර ඉදිකිරීම සඳහා එකඟවී ඇති බව පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ විසින් දන්වා තිබු නමුත් මෙතෙක් ගොඩනැඟිල්ල විද්‍යාලංකාර භාරය වෙත පැවරීම සඳහා කටයුතු කර නොතිබුණි. | උපදේශන සේවා ලබාගැනීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. | |
| (ii) ඒ අනුව ගොඩනැඟිල්ලේ v වන අදියරේ කටයුතු 2019 මාර්තු 15 දින වන විට අවසන් කර තිබුණද vi අදියරේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් විදුලිය සහ ආරක්ෂක වියදම් දරමින් නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය කෙරේ. | වර්ෂයේ ඉටුකරන ලද 2019 කාර්යයන්හි විචලනයන්ට අදාලව දරන ලද විදුලිය හා ආරක්ෂක වියදම් අමාත්‍යාංශය මඟින් දැරිය යුතු වියදම් වේ. | සැලසුම් කළ පරිදි භාවිතයට ගතයුතු බව. |

**3.2 ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සංස්කෘතික අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත අමාත්‍යාංශය වෙත පූර්ණ කොටස් අයිතිය ඇතිව සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් (පුද්) සමාගම 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ 2008 නොවැම්බර් 17 දින ලියාපදිංචි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති ස්වකීය කොටස් වලින් සියයට 50 ක් හෝ වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් විසින් හෝ දරනු ලබන සමාගම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු වුවද අමාත්‍යාංශයේ පූර්ණ හිමිකාරිත්වය සතු මෙම සමාගමේ 2018/2019, 2019/2020 හා 2020/2021 යන මූල්‍ය වර්ෂ වලට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා | අමාත්‍යාංශ විෂය පථය විටින් විට සංශෝධනය වීමේ දී සංස්කෘතික සංරක්ෂණ ඉදිකිරීම් පෞද්ගලික සමාගමේ ලිපිගොනු ද විවිධ අංශ වෙත හුවමාරු වී තිබීම හේතුවෙන් අවශ්‍ය ලිපිගොනු සොයා ගැනීමේ අපහසුතාවයන් පවතී. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව අදාල සමාගම්වල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව. |

| | | |
|---|---|---|
| විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) අදාල සමාගම පිහිටුවා ඇත්තේ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු බාහිර ආයතන ලවා ඉටුකරවා ගැනීමේදී සිදුව තිබූ අපහසුතා හා ගැටලු මඟහරවා ගැනීම පිණිස වුවද සමාගම විසින් 2009 සහ 2010 කාල සීමාව තුළ භාරගන්නා ලද, අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතනවල ඉදිකිරීම්, 5% ක පමණ ආන්තිකයක් තබාගෙන උප කොන්ත්‍රාත්කරුවන්ට පවරා ඉටුකරවා ගැනීම තුළ එම අපහසුතා හා ගැටලු තවදුරටත් සිදුව තිබුණි. | -එම- | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සමාගම ලවා අපහසුතාවයකින් තොරව ඉටුකරවා ගත යුතු බව. |
| (ඇ) වර්තමානයේ සමාගමේ කටයුතු සම්පූර්ණයෙන්ම අක්‍රිය වී ඇති බැවින් සමාගම ඇවර කිරීමට 2021 ජුලි 05 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙතින් ඉල්ලා තිබුණද ඇවර කිරීමේ ක්‍රියාවලිය මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | සමාගමේ කටයුතු ඇවර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ ද එම කටයුතු මේ දක්වා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබේ. | අක්‍රියව පවතින සමාගම සම්බන්ධයෙන් නීත්‍යානුකූල විධිවිධාන අනුගමනය කළ යුතු බව. |

### 3.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------ | නිර්දේශය<br>---------------- |
|---|---|---|
| (අ) තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන ක්‍රියාත්මක කළුතර දිස්ත්‍රික්කයේ විහාරස්ථාන හා දහම්පාසල් 04 ක් සඳහා පුස්තකාල පහසුකම් සැපයීම වෙනුවෙන් රු.530,000 ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර එම ප්‍රතිපාදන වෙන්කර මාස 05 කට වැඩි කාලයක් ගතවී තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විටත් අදාල උපකරණ දහම්පාසල් වෙත ලැබී නොතිබුණි. | බස්නාහිර පළාත් සභාවේ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙතින් ඇණවුම් කර තිබුණද මේ වනවිටත් එම උපකරණ ලැබී නොමැති අතර හැකි ඉක්මනින් කාර්යාලය වෙත භාර දෙන බව කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. | වැඩසටහන් නියමිත කාලය තුළ සම්පූර්ණ කළ යුතු බව. |
| (ආ) මාවතගම, බමුණාකොටුව හා පොල්ගහවෙල යන සංස්කෘතික මධ්‍යස්ථානවල ඉදිකිරීම්වලට අදාල කොන්ත්‍රාත්තු පිළිවෙලින් රු.14,665,744 කට රු.19,999,732 කට හා රු.11,086,971 කට 2016 වසරේ සමාගමකට පවරා තිබුණි. | මේ වන විට බමුණාකොටුව සංස්කෘතික මධ්‍යස්ථානයේ පමණක් ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර පොල්ගහවෙල හා මාවතගම යන සංස්කෘතික මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතු අවසන් කර | අදාල ඉදිකිරීම් සැලසුම් කළ පරිදි සම්පූර්ණ කර භාවිතයට ගත යුතු බව. |

| | |
|---|---|
| අදාල ඉදිකිරීම් පිළිවෙලින් 2016 දෙසැම්බර් 25, 2016 දෙසැම්බර් 23 හා 2017 ජනවාරි 03 යන දිනවල නිමකල යුතු වුවද 2021 දෙසැම්බර් දක්වා අදාල ඉදිකිරීම් නිමකර ගොඩනැඟිලි භාර දී නොතිබුණි. | නොමැත. |

**3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.21,383,325 ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබූ උහණ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමේ කාර්යය සඳහා 2015 වර්ෂයේ සිට 2021 දක්වා වරින් වර රු.40,047,970 ක ප්‍රතිපාදන අම්පාර දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණද, ඉදිකිරීම් ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කිරීමක්ද අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිම කර නොතිබුණි. | ප්‍රගතිය පරීක්ෂා කර, ඉදිකිරීම් කටයුතු කඩිනමින් කිරීමට ප්‍රතිපාදන නිදහස් කර ඇති බව අමාත්‍යාංශය විසින් සිදු කළ කේෂේත්‍ර පරීක්ෂාවේදී තහවුරු විය. | සංස්කෘතික මධ්‍යස්ථාවල ඉදිකිරීම් කටයුතු අවසන්ව නොතිබුණු අතර ඉදිකිරීම් සැලසුම් කළ පරිදි සම්පූර්ණ කර භාවිතයට ගත යුතු බව. |

**3.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්කෘතික අංශය සතු වාහන 16 ක් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත මුදාහැර තිබුණද එම මාරු කිරීම් හා පැවරීම් සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි II කොටසෙහි 8.1 පරිදි කටයුතු කර නොතිබුණි. | ආයතන තුනක් වෙත ලබාදුන් වාහන 07 ක් විධිමත් පරිදි මෝටර් රථ ප්‍රවාහන ආකෘති පත්‍ර එම්.ටී. 6 හි 8 ලේඛණ මගින් පැවරීම් කර, කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයාට පිටපතකින් දැන්වීමට හා වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති අතර තවත් වාහන 03 ක් රාජකාරී අවශ්‍යතාවය මත තාවකාලිකව මුදාහැර ඇති බැවින් පැවරීම් සිදුකර නොමැත. | මුදාහැර ඇති වාහන නීත්‍යානුකූලව පැවරීමට සහ වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) සංස්කෘතික අංශය සතු අපහරණය කල යුතුව පැවති වාහන 06 ක් සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි I කොටසෙහි 13.2 (ආ) වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි. | වාහන දෙකක් වෘත්තිය පුහුණු ආයතනය වෙත මුදාහැරීමටත් ත්‍රිරෝද රථ තුනක් අබලි ද්‍රව්‍ය ලෙස විකිණීමටත් එක් ත්‍රිරෝද රථයක් අපහරණයටත් අවශ්‍ය කටයුතු කරමින් පවතී. | අළුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් වාසි සහගත නොවන වාහන අපහරණය සඳහා යොමුකළ යුතු බව. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු.මිලියන 312.49 ක් වැය කර ඉදිකර තිබූ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යනු ලබන ගොඩනැඟිල්ලේ වර්ග අඩි 33547ක විශාල ඉඩකඩ ප්‍රමාණයක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණද අමාත්‍යාංශය යටතේ පවතින ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව හා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිවෙලින් රු.4,200,000 ක හා රු.6,816,000 ක කුලියකට වාර්ෂික කුලි පදනම මත පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වා ගෙන යමින් පැවතුණි. මේ සම්බන්ධයෙන් 2020 විගණන වාර්තාවේ ද සඳහන් කර තිබූ නමුත් ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | ගොඩනැඟිල්ලේ මහල්වල ඉතිරි වැඩ නිම කිරීමට හා අභ්‍යන්තර බෙදා වෙන්කිරීම් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතින අතර එම කටයුතු නිමවූ පසු බුද්ධශාසන අමාත්‍යාංශය, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සහ කුලි පදනම මත සිටින ආයතන එම ගොඩනැඟිල්ලේ ස්ථාපිත කිරීමට අවධානය යොමුකර ඇත. | නිෂ්කාර්යව පවත්නා වත්කම් උපරිම ආකාරයෙන් භාවිතයට ගත යුතු බව. |

(ආ) **නාගදීප විහාරස්ථානයේ සංවර්ධන කටයුතු**

රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වීමට සැලසුම් කර තිබූ යාපනය දිස්ත්‍රික්කයේ විහාරස්ථානවලට අදාලව සිදුකරන ලද ප්‍රතිසංස්කරණ සඳහා නාගදීප විහාරස්ථානය වෙනුවෙන් රු.12,736,743 ක මුදලක් වැය කර තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) විහාර මන්දිරයේ පිපිරීම් සිදු වී ඇති ස්ථාන සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කර ජලය කාන්දුවීම වළක්වන තීන්ත 3 වරක් ආලේප කිරීමට රු 4,500,888 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද විගණිත දිනය වූ 2022 පෙබරවාරි 19 වන විටත් ජලකාන්දු වීම් සිදුවෙමින් පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | සැලසුම් කළ පරිදි අදාල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ යුතු බව |
| (ii) විදේශීය බැතිමතුන් සහ දේශීය බැතිමතුන් වෙනුවෙන් වැසිකිළි පද්ධති ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.1,834,946 ක් සහ රු.941,912 ක් වැය කර තිබුණද ඉදිකර තිබූ වහලවල ජල කාන්දුව පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iii) | කොවිඩ් මර්ධන මාර්ගෝපදේශ අනුව රාජ්‍ය වෙසක් උත්සවය අවලංගු කර තිබුණද විහාරයට ඇතුළුවන ස්ථානයේ වෙසක් උත්සවය වෙනුවෙන් තාවකාලික තොරණක් ඉදිකිරීම සඳහා ගෙවා තිබූ රු.475, 000 ක මුදල නාවික හමුදාව වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි | අවලංගු කරන ලද ව්‍යාපෘතියට අදාල ප්‍රතිපාදන නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (iv) | රාජ්‍ය වෙසක් උත්සවය සඳහා සකස් කිරීමට නියමිතව තිබූ වේදිකාව සඳහා අවශ්‍ය රෙදි ආවරණ (canopy) වෙනුවෙන් රු. මිලියන 1.02 ක මුදලක් නාවික හමුදාව වෙත නිදහස් කර තිබුණි. කොරෝනා වසංගතය හේතුවෙන් වෙසක් උත්සවය අවලංගු වුවද, අදාල මුදල ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | -එම- |
| (v) | උක්ත සඳහන් සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය මාසිකව වාර්තා කරන ලෙස නාවික හමුදාපති දැනුවත් කර ඇතත් ප්‍රගතිය සමාලෝචනය කළ බවට හෝ ප්‍රගති වාර්තා ලබා ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘති සම්බන්ධ ප්‍රගතිය මාසිකව ලබා ගත යුතු බව. |
| (ඇ) | වාහන අලුත්වැඩියා කිරීමේදී ටෙන්ඩර් පිළිබඳ සාමාන්‍ය නියෝග අදාල කරගත යුතු වුවද, මුදල් රෙගුලාසි 1644 (IV) අනුව කටයුතු නොකර 2017 නොවැම්බර් මාසයේදී මෝටර් රථයක අළුත්වැඩියාව සෘජුවම පුද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි. අදාල සමාගම විසින් රථය පරික්ෂා කිරීමේ හා නවතා තැබීමේ ගාස්තු ලෙස දිනකට රු.500 බැගින් ගෙවන ලෙස 2020 වසරේදී දන්වා තිබුණද මේ පිළිබඳ අවධානය යොමු කර නොතිබීම නිසා අදාල වාහනය ඉක්මනින් හා අඩු පිරිවැයකින් අලුත්වැඩියා කර ගැනීමට නොහැකිව තිබූ අතර අදාල සමාගම මඟින්ම රු.1,258,981 ක් වැය කරමින් අලුත්වැඩියාව කර ගැනීමට සිදු වී තිබුණි. | 2017 වර්ෂයේ වාහන අළුත්වැඩියා කිරීම සඳහා යොමු කර ඇති අතර අළුත්වැඩියා කර අමාත්‍යාංශයේ රාජකාරි සඳහා යොදවා ඇත. | ආයතනයට ආර්ථිකමය වශයෙන් පාඩු නොවන ලෙස චක්‍රලේඛ විධිවිධාන හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ඈ) | අන්තර් රාජ්‍ය සේවා නිර්මාණ තරඟාවලිය-2020 සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| | (i) සැලසිනේ රූපවාහිනී ආයතනය වෙත | මෙම උත්සවය ඉතාමත් කෙටි | නිර්මාණ |

| | | | |
|---|---|---|---|
| | රු.328,800 ක් (VAT සහිත) ගෙවා ඉහත තරඟාවලියේ ජයග්‍රාහී නිර්මාණ ඇතුලත් කරමින් "ප්‍රභාෂ්වර" නමින් ග්‍රන්ථයක පිටපත් 300 ක් මුද්‍රණය කර තිබුණද අදාල ග්‍රන්ථය අමාත්‍යාංශය වෙත භාරදී තිබුණේ සම්මාන ප්‍රදානෝත්සවය අවසන් වී මාස 04 කටත් පසුව බැවින් ග්‍රන්ථය 2021 මාර්තු 18 දින පැවති සම්මාන ප්‍රදානෝත්සවයේදී බෙදා දීමට නොහැකිවී තිබුණි. | කාලයක් තුළ සැලසුම් කරන ලද බැවින් සැලසිනේ රූපවාහිනී ආයතනයෙන් සෘජු මිලදී ගැනීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් පිටපත් 300ක් මුද්‍රණය කොට උත්සව දිනයේ දී ගෙන්වා ගත් නමුදු පිටපත් 17 ක තිබූ මුද්‍රණ දෝෂ නිසා නැවතත් අදාල ආයතනය වෙත යවා නිවැරදි කර ගන්නා ලදී. එදින ජයග්‍රාහකයන් 122ක් හට ත්‍යාග සමඟින් ජයග්‍රාහී පිටපත් පිරිනමන ලදී. ගෙවීම් සිදු කරන අවස්ථාවේදී ගබඩා පොත් වලට ඇතුලත් වී නොමැති බව නිරීක්ෂණය වූ බැවින් පසු දිනක පොත්වලට ඇතුලත් කර ඇත. නිවැරදි ක්‍රියාවලිය අනුගමන කරන ලෙස උපදෙස් දී ඇත. මේ වන විට 2020 ජයග්‍රාහී ග්‍රන්ථ 6ක් ප්‍රවර්ධන අංශයේ ඇත. | තරඟාවලිය නිසි ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු බව. |
| (ii) | මෙම ග්‍රන්ථයෙහි පිටපත් 300 න් පිටපත් 200ක් අමාත්‍යාංශ ප්‍රවර්ධන අංශයෙහි 2022 මාර්තු 31 දින වන විටද පැවතිණි. | 2019 ජයග්‍රාහී ප්‍රභාස්වර ග්‍රන්ථ 99ක් ද මේ වන විට ප්‍රවර්ධන අංශයේ ඇති අතර, ඉහත 2020හි ග්‍රන්ථ 96 සමඟින් මුළු ග්‍රන්ථ 195ක් සංස්කෘතික මධ්‍යස්ථානවල පොත් මිලදී ගැනීම යටතේ පුස්තකාල වෙත බෙදා දීමට තීරණය කර ඇත. | සැලසුම් කළ පරිදි බෙදාහැරිය යුතු බව. |

**4. යහපාලනය**

-----------------

**අභ්‍යන්තර විගණනය**

-----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38(ඊ) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වේ. මුදල් රෙගුලාසි 133 ප්‍රකාරවද ගණන් දීමේ නිලධාරී විසින් මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී සහ වගකීම ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතුය. | සංස්කෘතික අංශයේ පවතින අභ්‍යන්තර විගණක තනතුරෙහි පුරප්පාඩුව සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු පත්කර ඇත. ඔහු විසින් අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර ඇති අතර එහි පිටපතක් විගණනය වෙත ලබා දීමට උපදෙස් ලබා දී ඇත. | ජාතික විගණන පනතේ අංක 38(ඊ) වගන්තිය ප්‍රකාර අභ්‍යන්තර විගණකවරයෙකු ගෙන් සමන්විත ඒකකයක් පිහිටු විය යුතු බව. |

| | | |
|---|---|---|
| එසේ වුවද, අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා වූ අනුමත කාර්ය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර තිබුණද වසර කීපයක සිට අදාල තනතුර පුරප්පාඩුව පැවතුණි. අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සඳහා දහසකට ආසන්න කාර්ය මණ්ඩලයක් සහ දිවයින පුරා පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 194 ක් ක්‍රියාත්මකව පැවතියද සංස්කෘතික අංශය සඳහා 2021 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර හා ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණන කටයුතුද ඉටු කර නොතිබුණි. | | ජාතික විගණන පනතේ අංක 38(ඊ) වගන්තිය ප්‍රකාර කටයුතු කළ යුතු බව. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 219 ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 169 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 50 කි. ඒ අතුරින් සහකාර ලේකම් තනතුරු 03 ක සංවර්ධන නිලධාරි තනතුරු 15 ක සංවර්ධන සහකාර තනතුරු 11 ක සහ කළමනාකරණ සහකාර නිලධාරි තනතුරු 8ක පුරප්පාඩු වර්ෂ කිහිපයක සිට පැවතුණු අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, කාර්යාල කාර්ය සහායක තනතුරක අතිරික්තයක් පැවතුණි. | සහකාර ලේකම්, සංවර්ධන නිලධාරි හා කළමණාකරන සහකාර තනතුරු සඳහා ඉල්ලුම් කර ඇති අතර මෙතෙක් ඒ සඳහා නිලධාරීන් ලබා දී නොමැත. සංවර්ධන සහකාර තනතුරු 1.1 සිටින නිලධාරීන්ට පෞද්ගලික වනසේ පවතින තනතුරුවල පුරප්පාඩු පිරවිය නොහැකි වන අතර ඒ වෙනුවට සංවර්ධන නිලධාරි සේවයේ තනතුරු අනුමත කර දෙන මෙන් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන අනුමත පරිදි කාර්ය මණ්ඩලය බඳවා ගත යුතු බව. |
| (ආ) අමාත්‍යාංශය සතුව සංස්කෘතික මධ්‍යස්ථාන 194 ක් පැවතුණද මධ්‍යස්ථාන මුරකරුවන් 306 ක් සේවයේ යොදවා තිබූ අතර 2020 දෙසැම්බර් 10 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දරන්නාට පමණක් පෞද්ගලික වන සේ මුරකරුවන් 114 ක් අනුමත කිරීම හේතුවෙන් මෙම අතිරික්තය වාර්තා වී තිබුණි. විගණනය විසින් සිදුකල පරීක්ෂාවන් අනුව මෙම අතිරික්ත මුරකරුවන් 105 දෙනාගේ සේවය කාර්යක්ෂම අයුරින් ලබා ගැනීමට ද අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. | මධ්‍යස්ථාන මුරකරුවන් දෙදෙනෙකු සිටින මධ්‍යස්ථානවල කාර්ය සහායක තනතුරු පුරප්පාඩු එම මුරකරු විසින් සම්පූර්ණ කරයි. කාර්ය සහායක තනතුරු සම්පූර්ණ වී ඇති මධ්‍යස්ථානවල මුරකරුවන් දෙදෙනෙකු සිටිනම් දිවා රාත්‍රි එම මුරකරුවන් සේවයේ යොදවා ඇත. | බඳවාගන්නා ලද තනතුරට අදාල කාර්යයෙහි කාර්යක්ෂම ලෙස යෙදවිය යුතු බව. |